<u>ව්‍යාපාර නාම ලියාපදිංචිය කිරීම සඳහා උපදෙස්</u>

01) කාර්යාලයෙන් ලබාගත් ඉල්ලුම්පත්‍ර දෙක නිවැරදිව සම්පූර්ණ කරන්න. (ව්‍යාපාරයේ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සම්පූර්ණ කරන්න.)

02) ඔබගේ ව්‍යාපාරයට ආහාර ද්‍රව්‍ය අදාළ වේ නම්, මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙතින් නිර්දේශ ලිපියක් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ. (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඒ සඳහා කටයුතු කරනු ඇත.)

03) ව්‍යාපාරික ස්ථානය ඔබට අයත් නම්,
- එම ස්ථානය පිහිටි ඉඩමේ ඔප්පුවේ හෝ බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක්.

04) ව්‍යාපාරික ස්ථානය ඔබට අයත් නොවේ නම් ,
- ස්ථානය අයත් පුද්ගලයාගෙන් අදාළ වසමේ ග්‍රාම නිලධාරී ඉදිරිපිට කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපියක්
- අදාළ ඔප්පුවේ සහතික කරන ලද පිටපතක්
- ඥාති සම්බන්ධය තහවුරු කිරීමට අදාළ උප්පැන්න සහතික, විවාහ සහතික, මරණ සහතික වල සහතික කරන ලද පිටපත්
- ඉඩමේ අයිතිය හිමි පුද්ගලයා මියගොස් ඇත්නම් එම පුද්ගලයාගේ මරණ සහතිකයේ පිටපතක් සහ ඉඩමට හිමිකම් ඇති සියලු දෙනාගේ ම ග්‍රාම නිලධාරි ඉදිරියේ, ව්‍යාපාරය කරගෙන යෑම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපියක්

05) පුහුණු පාඨමාලාවකට අදාළ ව්‍යාපාරයක් නම් එම පාඨමාලා සහතික සහ ඒවායේ පිටපත්

06) පරිසර බලපත්‍ර අවශ්‍ය වේ නම්, (වී මෝල්, ගරාජ්, ලී මෝල්, සර්විස් සෙන්ටර්, කොන්ක්‍රීට් වැඩපළවල්, .......)

07) කෘමිනාශක අලෙවිසැල් සඳහා පලිබෝධ නාශක පිළිබඳ ලබා දෙන පුහුණු සහතිකය

08) ජාතික හැඳුනුම්පතෙහි පැහැදිලි ඡායා පිටපතක්

09) ග්‍රාම නිලධාරි මගින් ලබා ගත් පදිංචි සහතිකය

**සැලකිය යුතුයි - ඉදිරිපත් කරනු ලබන සියළුම සහතිකවල ඡායා පිටපත් ග්‍රාම නිලධාරී විසින් සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතු ය.**